# මාසික වෙළඳ විවරණිකාව


ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව


ශ්‍රී ලංකා මහ බැංකුව

2023 දෙසැම්බර්

05 වෙළුම 12 නිකුතුව


## විශේෂ සිදුවීම්





2023 වසරේ දෙසැම්බර් මාසය තුළ දී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 1,002ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 6.2කින් පහළ ගියේය.

2023 වසරේ දෙසැම්බර් මාසය තුළ දී වෙළඳ භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,489ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 4.4කින් ඉහළ ගියේය.





2023 වසරේ අපනයන ආදායම වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 9.1කින් පහළ ගියේය. ඊට සමගාමීව, එම කාලපරිච්ඡේදය තුළ ආනයන වියදම ද සියයට 8.1කින් අඩු විය.


වෙළඳ ගිණුමේ හිඟය, 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 358ට සාපේක්ෂව 2023 වසරේ දෙසැම්බර් මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 487ක් දක්වා පුළුල් විය.

## ප්‍රධාන අපනයන හා ආනයන කාණ්ඩ - (2023 ජන. - දෙසැ.)




# අපනයන ක්‍රියාකාරිත්වය

### අපනයන ක්‍රියාකාරිත්වය - (ජන. - දෙසැ.)




### අපනයන පරිමා හා මිල දර්ශක - (ජන. - දෙසැ.)




2023 වසර තුළ දී කාර්මික, කෘෂිකාර්මික සහ ඛනිජ නිෂ්පාදිත ආදි ප්‍රධාන අපනයන කාණ්ඩයන්හි ආදායම පහළ යෑම හේතුවෙන් වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත අපනයන ආදායම පහළ ගියේය.


2023 වසර තුළ දී, පෙර වසරට සාපේක්ෂව අපනයන පරිමා දර්ශකය සියයට 1.9කින් ඉහළ ගිය අතර, අපනයන මිල දර්ශකය සියයට 10.8ක පහළ යෑමක් වාර්තා කළේය.

## කෘෂිකාර්මික අපනයන


### කෘෂිකාර්මික අපනයන ආදායම




### කෘෂිකාර්මික අපනයන පරිමා හා මිල දර්ශක





### තේ සහ රබර් මිල ගණන් *




*2022 වසරේ ජූලි මාසයේ දී රබර් (දුම් ගැසූ දාර රබර්) සඳහා වෙන්දේසියේ දී මිල ගණන් නියම වී නොමැත


### කෘෂිකාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන. - දෙසැ.)





2023 වසර තුළ දී, ප්‍රධාන වශයෙන් පොල් ආශ්‍රිත නිෂ්පාදිත, ස්වභාවික රබර් සහ මුහුදු ආහාර අපනයන ආදායම පහළ යෑම හේතුවෙන් කෘෂිකාර්මික අපනයන ආදායම පෙර වසරට සාපේක්ෂව සුළු වශයෙන් පහළ ගියේය. මීට ප්‍රතිවිරුද්ධව, මෙම වසර තුළ තේ, කුළුබඩු සහ සකස් නොකළ දුම්කොළ අපනයන ආදායම ඉහළ යෑමක් සිදුවිය.

# කාර්මික අපනයන


## කාර්මික අපනයන ආදායම





## කාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




## කාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන. - දෙසැ.)





## නැව් හා ගුවන් යානා ඉන්ධනවල අපනයන මිල ගණන්





2023 වසර තුළ දී ප්‍රධාන වශයෙන් ඇඟලුම් අපනයන ආදායම පහළ යෑම හේතුවෙන් කාර්මික අපනයන ආදායම පෙර වසරට සාපේක්ෂව පහළ යෑමක් වාර්තා කළේය. තව ද, රබර් නිෂ්පාදිත, රසායනික නිෂ්පාදිත, ඛනිජතෙල් නිෂ්පාදිත සහ සත්ත්ව ආහාර අපනයන ආදායමෙහි කැපී පෙනෙන පහළ යෑම් දක්නට ලැබුණි. කෙසේ වුවත්, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ, ප්‍රවාහන උපකරණ සහ ආහාර, පාන වර්ග හා දුම්කොළ අපනයන ආදායම ඉහළ ගියේය.

# ආනයන ක්‍රියාකාරිත්වය

## ආනයන ක්‍රියාකාරිත්වය - (ජන. - දෙසැ.)





## ආනයන පරිමා හා මිල දර්ශකය - (ජන. - දෙසැ.)





පාරිභෝගික භාණ්ඩ ආනයන වියදමෙහි ඉහළ යෑමක් දක්නට ලැබුන ද, අන්තර් සහ ආයෝජන ඇතුළු ආනයන කාණ්ඩවල ආනයන වියදම පහළ යෑම හේතුවෙන් 2023 වසර තුළ දී, වෙළඳ භාණ්ඩ ආනයන වියදම පෙර වසරට සාපේක්ෂව පහළ ගියේය. මේ අතර, 2023 වසර තුළ දී ආනයන පරිමා දර්ශකය සියයට 3.0කින් ඉහළ ගිය අතර, ආනයන මිල දර්ශකය සියයට 10.8කින් පහළ ගියේය.

## පාරිභෝගික භාණ්ඩ ආනයන


### පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම





### පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




### පාරිභෝගික භාණ්ඩ ආනයනවල ක්‍රියාකාරිත්වය (ජන. - දෙසැ.)





### සීනි, පරිප්පු සහ කිරිපිටි සඳහා වූ ආනයන මිල ගණන් වල සාමාන්‍ය





ප්‍රධාන වශයෙන් බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත ඇතුළු ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන් 2023 වසර තුළ දී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පෙර වසරට සාපේක්ෂව ඉහළ ගියේය. 2023 වසර තුළ ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත (සහල්), රෙදිපිළි හා උපාංග සහ ගෘහ උපකරණ ආනයන වියදම පහළ ගිය ද, සීනි සහ මේද හා තෙල් වර්ග ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන් ආහාර හා පාන වර්ග ආනයන වියදම ද ඉහළ ගියේය.

## අන්තර් භාණ්ඩ ආනයන


### අන්තර් භාණ්ඩ ආනයන වියදම





### අන්තර් භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක



**අන්තර් භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජන. - දෙසැ.)**




**බොර තෙල් හා පොහොර ආනයන මිල ගණන් (මාසික සාමාන්‍ය අගයන්)**





* 2022 වසරේ මාර්තු, අප්‍රේල්, ජූනි, ජූලි, ඔක්තෝබර් මාසවල සහ 2023 වසරේ පෙබරවාරි සහ සැප්තැම්බර් මාස වල දී බොරතෙල් ආනයනය කර නැත.


මූලික වශයෙන්, රෙදිපිළි හා රෙදිපිළි උපාංග, ඉන්ධන, ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත සහ රසායනික නිෂ්පාදිත ආනයන වියදම පහළ යෑම හේතුවෙන්, 2023 වසර තුළ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත පහළ ගියේය. පිරිපහදු කළ ඛනිජතෙල් ආනයන අඩු වීම ඉන්ධන ආනයන වියදම පහළ යෑමට හේතු විය. මීට ප්‍රතිවිරුද්ධව, 2023 වසර තුළ දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග, තිරිඟු සහ කෘෂිකාර්මික යෙදවුම් ආනයන වියදම ඉහළ ගියේය.

## ආයෝජන භාණ්ඩ ආනයන


**ආයෝජන භාණ්ඩ ආනයන වියදම**




**ආයෝජන භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක**




**ආයෝජන භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජන. - දෙසැ.)**




ගොඩනැගිලි ද්‍රව්‍ය, යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ ප්‍රවාහන උපකරණ යන සියලු ප්‍රධාන ආයෝජන භාණ්ඩ කාණ්ඩවල ආනයන වියදම පහළ යෑම හේතුවෙන්, 2023 වසර තුළ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම පහළ ගියේය.

# විදේශීය වෙළඳාම - සාරාංශය (අ)

## අපනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| | | දෙසැ. 2022 | දෙසැ. 2023 | වෙනස (%) | ජන. -දෙසැ. 2022 | ජන. -දෙසැ. 2023 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකාර්මික අපනයන** | | **203.4** | **206.6** | **1.6** | **2,568.0** | **2,566.5** | **-0.1** |
| එයින් | තේ | 107.3 | 111.1 | 3.6 | 1,258.8 | 1,309.9 | 4.1 |
| | පොල් | 24.8 | 23.2 | -6.6 | 400.3 | 336.8 | -15.9 |
| | කුළුබඩු | 31.3 | 31.3 | -0.2 | 368.7 | 392.9 | 6.5 |
| | මුහුදු ආහාර | 21.3 | 23.8 | 11.6 | 269.0 | 262.2 | -2.5 |
| **කාර්මික අපනයන** | | **840.9** | **790.9** | **-5.9** | **10,465.3** | **9,277.7** | **-11.3** |
| එයින් | රෙදිපිළි හා ඇඟලුම් | 481.5 | 439.9 | -8.6 | 5,952.0 | 4,878.9 | -18.0 |
| | රබර් නිෂ්පාදිත | 71.2 | 78.1 | 9.7 | 977.0 | 902.2 | -7.7 |
| | ඛනිජ තෙල් නිෂ්පාදිත | 49.4 | 61.1 | 23.6 | 568.0 | 539.4 | -5.0 |
| | ආහාර, පාන වර්ග හා දුම්කොළ | 36.7 | 44.3 | 20.6 | 519.5 | 539.3 | 3.8 |
| | යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 50.5 | 43.1 | -14.8 | 580.9 | 598.2 | 3.0 |
| | මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 35.3 | 24.5 | -30.6 | 450.6 | 500.0 | 11.0 |
| | සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 7.4 | 4.8 | -35.0 | 85.8 | 71.2 | -17.0 |
| **ඛනිජ හා වෙනත් අපනයන** | | **23.3** | **4.3** | **-81.8** | **73.2** | **66.4** | **-9.2** |
| **මුළු අපනයන** | | **1,067.6** | **1,001.8** | **-6.2** | **13,106.4** | **11,910.7** | **-9.1** |

## ආනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | | දෙසැ. 2022 | දෙසැ. 2023 | වෙනස (%) | ජන. -දෙසැ. 2022 | ජන. -දෙසැ. 2023 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | | **241.5** | **272.8** | **12.9** | **2,813.0** | **3,043.9** | **8.2** |
| **ආහාර හා පාන වර්ග** | | 129.9 | 152.0 | 17.0 | 1,607.9 | 1,693.0 | 5.3 |
| එයින් | එළවළු (ආ) | 21.3 | 32.1 | 50.8 | 318.4 | 358.6 | 12.6 |
| | සහල් | 8.3 | 1.0 | -87.4 | 292.5 | 17.1 | -94.2 |
| **වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ** | | 111.6 | 120.8 | 8.2 | 1,205.1 | 1,350.9 | 12.1 |
| එයින් | බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 57.8 | 46.7 | -19.3 | 533.4 | 667.0 | 25.0 |
| **අන්තර් භාණ්ඩ** | | **983.8** | **948.3** | **-3.6** | **12,438.8** | **11,006.6** | **-11.5** |
| එයින් | ඉන්ධන | 383.5 | 414.2 | 8.0 | 4,896.8 | 4,702.6 | -4.0 |
| | රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 200.9 | 183.2 | -8.8 | 3,065.2 | 2,371.2 | -22.6 |
| | පොහොර | 115.8 | 34.5 | -70.2 | 275.9 | 235.0 | -14.8 |
| | තිරිඟු හා ඉරිඟු | 35.8 | 19.9 | -44.3 | 303.1 | 338.2 | 11.6 |
| **ආයෝජන භාණ්ඩ හා වෙනත්** | | **200.2** | **267.5** | **33.6** | **3,039.2** | **2,760.6** | **-9.2** |
| එයින් | යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 130.0 | 174.9 | 34.6 | 1,969.0 | 1,867.6 | -5.1 |
| **මුළු ආනයන** | | **1,425.6** | **1,488.6** | **4.4** | **18,291.0** | **16,811.1** | **-8.1** |

## වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | දෙසැ. 2022 | දෙසැ. 2023 | වෙනස (%) | ජන. -දෙසැ. 2022 | ජන. -දෙසැ. 2023 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **වෙළඳ ශේෂය** | -358.0 | -486.8 | | -5,184.6 | -4,900.4 | |

## වෙළඳ දර්ශක හා වෙළඳ මිල අනුපාතය (2010 = 100) (ඇ)

| කාණ්ඩය | | දෙසැ. 2022 | දෙසැ. 2023 | වෙනස (%) | ජන. -දෙසැ. 2022 | ජන. -දෙසැ. 2023 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **අපනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 148.6 | 139.4 | -6.2 | 152.0 | 138.1 | -9.1 |
| | පරිමා දර්ශකය | 170.4 | 167.0 | -2.0 | 163.0 | 166.1 | 1.9 |
| | මිල දර්ශකය | 87.2 | 83.5 | -4.3 | 93.3 | 83.2 | -10.8 |
| **ආනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 127.6 | 133.2 | 4.4 | 136.4 | 125.4 | -8.1 |
| | පරිමා දර්ශකය | 121.8 | 141.2 | 16.0 | 126.0 | 129.8 | 3.0 |
| | මිල දර්ශකය | 104.8 | 94.3 | -10.0 | 108.3 | 96.6 | -10.8 |
| **වෙළඳ මිල අනුපාතය** | | 83.2 | 88.5 | 6.3 | 86.1 | 86.1 | -0.1 |

(අ) තාවකාලික

(ආ) පරිප්පු, ළූණු, අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.

(ඇ) එ.ජ. ඩොලර්වලින් ගණනය කරන ලද